# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11.763 — 1959 ජූනි 5 වැනි සිකුරාද — 5.6.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV වැනි කොටස—පලාත් පාලනය

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබාගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට | | පිට |
|---|---|---|---|
| පලාත් පාලන නිවේදන ... ... | 509 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... | — | අය-වැය ලේඛන ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | දේපළ විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — | මාර්ග කොමිටි දැන්වීම් ... ... | — |
| පලාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... | — |


## පලාත් පාලන නිවේදන

### 1939 යේ අංක 61 දරන පලාත් ආණ්ඩු සභා ආඥපනත

1947තේ සැප්තැම්බර් මස 24 වැනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මදක් වෙනස් කරන ලද, 1939යේ අංක 61 දරන පලාත් ආණ්ඩු සභා ආඥපනතේ 196 වැනි වගන්තියෙන් මා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර, පලාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ වැඩ බලන අමාත්‍ය මුතුබණ්ඩා වීරසේකර මැදිවක වන මා විසින් එකී වගන්තිය යටතේ 1957 තේ ජූලි මස 4 වැනි දින අංක 11,140 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය, එහි (බී) ඡේදය අස්කොට ඒ වෙනුවට මෙහි පහත සඳහන් ඡේදය යෙදීමෙන්, මේ නියෝගයෙන් සංශෝධනය කර සිටිනු ලැබේ. එනම්:—

"(බී) වැලිගම නගරයේ කාර්ය කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ විශේශ කොමසාරිස්වරයා වශයෙනුත්, එකී කාරණය සඳහා පූර්වෝක්ත ආඥපනත යටතේ පලාත් ආණ්ඩු සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම පිණිස හා කටයුතු ඉටු කිරීම පිණිසත්, පලාත් පාලන සහකාර කොමසාරිස්වර පීටර් කලාසිං දිසානායක මහතා පත් කළයුතු වන්නේය."

ඇම්. බී. ඩබ්ලිව්. මැදිවක,
පාලත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ වැඩබලන
අමාත්‍ය තැන.

1959 මැයි මස 20 වැනි දින,
කොළඹ දීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිට**ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955 ජනවාරි 1 වැනි දින සිට** අය කරන ගාස්තු මෙසේ සි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් **කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | 25 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 31 | |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | 10 | |
| | තැපැල් ගාස්තුවත් සමග ... | 14 | |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය **කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.**

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.